(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 175.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2017 ජූනි මස 22 වැනි බ්‍රහස්පතින්දා පූ. භා. 10.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

465/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (7)

(අ) (i) 2015 වසර තුළ ජනාධිපතිතුමා සහභාගී වූ විදේශ සංචාර කවරේද;

(ii) එකී එක් එක් විදේශ සංචාරයට සහභාගී වූ පුද්ගලයන්ගේ නම්, තනතුරු සහ එම පුද්ගලයන් වෙනුවෙන් රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ආයතන විසින් දරන ලද වියදම වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

952/'16

ගරු බිමල් රත්නායක මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රාජ්‍ය සේවකයන්ට සහන මිලට යතුරුපැදි ලබාදීමේ වැඩපිළිවෙළ යටතේ තැපැල්කරුවන්ද යතුරුපැදි ඉල්ලා ඇති බවත්;

(ii) ඔවුන්ට මෙතෙක් යතුරුපැදි ලබාදී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම පිරිසට සහන මිලට යතුරුපැදි ලබාදීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1019/'16

ගරු නාමල් රාජපක්ෂ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) 2015 ජනවාරි මාසයේ සිට මේ දක්වා කාලය තුළ ජනාධිපතිතුමා විසින් විවෘත කරන ලද රාජ්‍ය හා සංස්ථාපිත ආයතනවලට අයත් ගොඩනැගිලි හා අනෙකුත් ඉදිකිරීම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ඉදිකිරීම්වලින්, 2015 ජනවාරි මාසයෙන් පසුව ආරම්භ කරන ලද ඉදිකිරීම් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1084/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තු නිල සුනඛ අංශයේ සිටින සුනඛයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සුනඛයන් නඩත්තු කිරීම සඳහා වර්ෂයකට වැයකරන මුදල කොපමණද;

(iii) උක්ත සුනඛයන්ගෙන් ගනු ලබන ප්‍රයෝජන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පොලිස් දෙපාර්තමේන්තුවට තවත් සුනඛයන් විදේශයන්ගෙන් ගෙන්වීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1099/'16

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ ගම්මාන රාශියක් මුහුදු ඛාදනයට ලක්වීමේ තර්ජනයකට ලක්වී ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එම ගම් කවරේද;

(iii) එසේ මුහුදු ඛාදනයට ලක් වූ ගම්මාන සහ එම ජනතාව වෙනුවෙන් යම් සහනශීලී වැඩසටහනක් අමාත්‍යාංශය මඟින් දියත් කර තිබේද;

(iv) එසේ නම්, ඒ පිළිබඳ විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

1119/'16

ගරු චමින්ද විජේසිරි මහතා,— සමාජ සවිබලගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බදුල්ල දිස්ත්‍රික්කයේ සමෘද්ධි, වැඩිහිටි දීමනා ආදී විවිධ සහනාධාර ලබන පුද්ගලයන් සංඛ්‍යාව, එක් එක් මැතිවරණ කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත (i) හි සඳහන් පුද්ගලයන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(iii) වත්මන් යහපාලන රජය මෙම පිරිසගේ ජීවන මට්ටම උසස් කිරීම සඳහා ඉදිරියේදී ක්‍රියාවට නැංවීමට අපේක්ෂිත වැඩසටහන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

1133/'16

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) South Asian Institute of Technology and Medicine නමැති ආයතනයක් විසින් ශ්‍රී ලංකාව තුළ හෙද, සෞඛ්‍ය, විද්‍යා හෝ වෛද්‍ය උපාධි පිරිනැමීමට අමාත්‍යාංශයේ අනුමතිය ඉල්ලා තිබේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) අමාත්‍යාංශය විසින් එම අවසරය ලබාදී තිබේද;

(iv) එසේ නම්, අවසර ලබාදීමේ ලිපිය සභාගත කරන්නේද;

(v) අමාත්‍යාංශයේ අවසරයකින් තොරව, සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාළ උපාධි පිරිනැමීමේ ආයතනයක් පවත්වාගෙන යාම නීත්‍යානුකූලද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

1180/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) යාපනය දිස්ත්‍රික්කය තුළ,

(i) 1983 වර්ෂය වනවිට වගා කරන ලද මුළු ගොවිබිම් ප්‍රමාණය කොපමණද;

(ii) 1982 හා 1983 වර්ෂවල වගා කරන ලද වගාබිම් ප්‍රමාණය, එක් එක් බෝගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වර්ෂ 1983න් පසුව 2009 වර්ෂයේ යුදමය තත්ත්වය නිමවන තෙක් වගා කරන ලද මුළු බිම් ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) යුදමය තත්ත්වය නිමවීමෙන් පසු මේ දක්වා වගා කරන ලද ගොවිබිම් ප්‍රමාණය, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඉහත සියල්ලෙහිම සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

1293/'16

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ වගා කරනු ලබන කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඉහත (i) හි සඳහන් ඉඩම් ප්‍රමාණය, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත (i) හි සඳහන් කුඹුරු ඉඩම් ප්‍රමාණය සඳහා දියවර සැපයෙන ආකාරය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) වර්ෂ 2013 සිට 2015 දක්වා මාතර දිස්ත්‍රික්කයේ වාර්තා වූ වී අස්වැන්න එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඉහත (iv) හි සඳහන් වී අස්වැන්න, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

1323/'16

ගරු වාසුදේව නානායක්කාර මහතා,— කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමු සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වතු කම්කරු වැටුප් පිළිබඳව ක්‍රියාත්මක සාමූහික ගිවිසුම පිළිබඳ විෂය භාර අමාත්‍යවරයාගේ සහ රජයේ වගකීම කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අයවැය සහන දීමනාවක් වූ පුද්ගලික අංශයේ සේවකයන්ගේ වැටුපට මාසිකව රු.2500/-ක් එකතු කිරීම, සාමූහික ගිවිසුම අනුව වතු කම්කරු මාසික වැටුපට එකතුවී නැති බවත්;

(ii) අවම වශයෙන් මූලික වැටුප දිනකට රුපියල් 500/-ක් සමග රුපියල් 1000/-ක් දක්වා වැඩි කළ යුතුව තිබූ බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) එසේ නම්, එම ස්ථාවරයේ පිහිටා එම වැඩිකරන ලද මුදල නොගෙවන හාම්පුතුන්ට විරුද්ධව නඩු දැමීමට කටයුතු කරන්නේද;

(ii) සාමූහිකව ගිවිසුමක් ඇති විටක රජය ගෙන එනු ලැබූ අයවැය සහන දීමනා නොගෙවන්නේ සාමූහික ගිවිසුමේ කොන්දේසි, සහන දීමනා නීතියට වඩා වැඩි වාසිදායක වන අවස්ථාවන්හිදී බව පිළිගන්නේද;

(iii) එසේ නොමැති නම්, සාමූහික ගිවිසුම අනුමත කළ හේතුව කවරේද;

(iv) මෙම රු.2500/- දීමනාවට සමාන මුදලක් දැනටමත් සමහර පුද්ගලික වතු පාලකයන් විසින් ඔවුන්ගේ කම්කරුවන්ට ගෙවනු ලබන බව දන්නේද;

(v) එසේ නම්, වතු සමාගම්වලට මෙම මුදල් ගෙවිය නොහැකි බවට ඔවුන් කරන ප්‍රකාශ පිළිගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

11.

1395/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැයෙහි අංක 165 සහ 166 යෝජනාවලට අනුව, 7 වන ශතවර්ෂය දක්වා වූ දීර්ඝ ඉතිහාසයක් ඇති, ශ්‍රී ලංකාවේ කුළුබඩු ගෝලීය වශයෙන් සන්නාමගත කිරීමේ වැඩපිළිවෙළ දියත් කිරීම සඳහා අයවැයෙන් වෙන් කළ රුපියල් මිලියන 150ක ප්‍රතිපාදනය වැය කළ ආකාරය පිළිබඳ වැය විස්තරයක් ඉදිරිපත් කරන්නේද;

(ii) 2016 වර්ෂය තුළදී උක්ත යෝජනාවට අනුව, කුරුඳු, ගම්මිරිස්, කරදමුංගු සහ සාදික්කා ආදී වගාවන් සඳහා කල්බදු පදනමින් ලබා දුන් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එම කල්බදුලාභීන්ගේ නාම ලේඛනයක් සභාගත කරන්නේද;

(iv) 2016 වර්ෂය තුළදී උක්ත වගාවන් සඳහා උනන්දු කරවනු ලැබූ ප්‍රාදේශීය වැවිලි සමාගම් කවරේද;

(v) උක්ත අයවැය යෝජනාවෙන් කුරුඳු පර්යේෂණ වෙනුවෙන් වෙන් කරන ලද රුපියල් මිලියන 50ක ප්‍රතිපාදනය වැය කළ ආකාරය පිළිබඳ තහවුරු කරනු ලැබූ වැය විස්තරයක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

12.

1587/’17

ගරු සන්දිත් සමරසිංහ මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා සබරගමුව පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය මඟින් ලබා දී ඇති මගී ප්‍රවාහන බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(ii) එම බලපත්‍ර ලබාගත් පුද්ගලයන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මගී ප්‍රවාහන බලපත්‍ර නොමැතිව සබරගමුව පළාතේ බස් රථ ධාවනය වන බවත්;

(ii) එමඟින් සබරගමුව මගී ප්‍රවාහන අධිකාරියට විශාල පාඩුවක් සිදුවන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

13.

1599/’17

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය හේතුවෙන් බරපතල පරිසර දූෂණයක් සිදුවන බවට චෝදනා ඉදිරිපත් වන බව දන්නේද;

(ii) නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරයෙන් සිදු වන අහිතකර වායු විමෝචනය වැළැක්වීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(iii) නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරයෙන් පිටවන අළු කළමනාකරණය කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(iv) නොරොච්චෝලේ බලාගාරයෙන් සිදුවන පරිසර දූෂණය අවම කිරීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය විසින් ඉදිරි කාලය තුළ කොපමණ මුදලක් ආයෝජනය කිරීමට අපේක්ෂා කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

14.

1675/’17

ගරු සෙය්යිඩ් අලී සාහිර් මවුලානා මහතා, — අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට, — (1)

(අ) 2008 දෙසැම්බර් මාසයේදී මඩකලපුව, කෝප්පායි සහ කොටගල යන ගුරු පුහුණු විද්‍යාලවලින් තම පුහුණුව නිමකර වන්නි දිස්ත්‍රික්කයේ පාසල්වලට පත්වීම් ලබාදෙන ලද පුහුණුව අවසන් කළ වහාම විභාගය පැවැත්වීමේ ක්‍රියාපටිපාටියට පටහැනි ලෙස 2009 අප්‍රේල් මාසයේදී අවසන් විභාගයට පෙනී සිටින ලෙස ඉල්ලා සිටිනු ලැබූ අභ්‍යාසලාභීන්ගේ නම් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත කී දිස්ත්‍රික්කය තුළ යුද්ධය උච්චතම අවස්ථාවට එළඹ තිබූ හෙයින් එම අභ්‍යාසලාභීන්හට දිස්ත්‍රික්කයෙන් පිටතට පැමිණීමට නොහැකි වූ බවත්;

(ii) ඔවුන් තම කණිෂ්ඨ කණ්ඩායම සමඟ විභාගයට මුහුණදුන් අතර එම කණිෂ්ඨ කණ්ඩායමට ලබාදුන් ප්‍රශ්න පත්‍රයටම පිළිතුරු ලබා දුන් නමුත්, කණිෂ්ඨ කණ්ඩායම සඳහා තම සහතිකය වලංගු වන දිනය ලෙස 2009.08.01 දින ලබාදුන් අතර ඔවුන්ගේ සහතිකය වලංගු වන දිනය 2011.01.01 ලෙස වෙනස් දිනයක් ලබා දී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) කණිෂ්ඨ කණ්ඩායමේ සහතිකය වලංගු වන දිනයම ඔවුන්හට ලබාදීමට පියවර ගන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

15.

1086/’16

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යුධ, ගුවන් සහ නාවික යන ත්‍රිවිධ හමුදාවන්වල රාජකාරි කටයුතු සඳහා යොදා ගනු ලබන සුනඛයන් සංඛ්‍යාව, එක් එක් හමුදාව අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම සුනඛයන් නඩත්තු කිරීම සඳහා වැය කරන මුදල, එක් එක් හමුදාව අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) උක්ත සුනඛයන්ගෙන් ගනු ලබන ප්‍රයෝජන, එක් එක් හමුදාව අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උක්ත හමුදාවන්ට තවත් සුනඛයන් විදේශයන්ගෙන් ගෙන්වීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල, එක් එක් හමුදාව අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය (අංක 1),— සුරාබදු ආඥාපනතේ (52 අධිකාරය වූ) 32 වගන්තිය සමඟ කියවිය යුතු 25 වගන්තිය යටතේ මත්පැන් බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2016 දෙසැම්බර් 15 දිනැති අංක 1997/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.06.06 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 992 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය (අංක 2),— සුරාබදු ආඥාපනතේ (52 අධිකාරය වූ) 32 වගන්තිය සමඟ කියවිය යුතු 25 වගන්තිය යටතේ අරක්කු බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2016 දෙසැම්බර් 20 දිනැති අංක 1998/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.06.06 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 994 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත යටතේ නියෝග,— 2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනතේ 6 වගන්තියේ (ඉ) ඡේදය සහ 21 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 51 වගන්තිය යටතේ මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 දෙසැම්බර් 06 දිනැති අංක 1996/27 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.06.07 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

*4.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්‍ෂ ජනරාල්වරයාගේ වැටුප් හා දීමනා ප්‍රතිශෝධනය කිරීම,— 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 16(1) වගන්තිය මඟින් කොමිෂන් සභාවට පැවරී ඇති කාර්යයන් ඉටු කරලීම පිණිස එම කොමිෂන් සභාවට සහාය වීමට අධ්‍යක්‍ෂ ජනරාල්වරයෙකු පත්කිරීමට සහ එම තනතුර දරන තැනැත්තාට පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලබන වැටුපක් ගෙවීමට විධිවිධාන සලස්වා දී ඇති හෙයින්ද;

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්‍ෂ ජනරාල් තනතුරට 2016.11.24 දින සිට නීතිපති දෙපාර්තමේන්තුවේ අතිරේක සොලිසිටර් ජනරාල් ධූරයේ රාජකාරි කළ ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න මහතා පත් කර ඇති හෙයින්ද;

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්‍ෂ ජනරාල් ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න මහතාට පෞද්ගලික වන සේ අතිරේක සොලිසිටර් ජනරාල් තනතුරට හිමි මාසික වැටුප හා රජයේ නිල නිවාසයක් ලබා දී නොමැති නම්, නිවාස කුලී දීමනාව ඇතුළු සියලු දීමනා (දුරකථන දීමනාව සහ ඉන්ධන දීමනාව හැර) ලබාදීමටත්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්‍ෂ ජනරාල් ධූරයට හිමි අමාත්‍යාංශ ලේකම් දීමනාව, දුරකථන දීමනාව සහ ඉන්ධන දීමනාව 2016.11.24 දින සිට ගෙවීමට අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබා දී ඇති හෙයින්ද;

ඊට අනුකූලව, 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්‍ෂ ජනරාල්, ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න මහතා වෙත රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන පරිදි ඉහත සඳහන් මාසික වැටුප හා දීමනා ගෙවීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

ශ්‍රී ලංකා තිරසාර සංවර්ධන පනත් කෙටුම්පත — විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2017 මාර්තු 08) [1].

*6.

බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම් සඳහා වූ ජාත්‍යන්තර සම්මුති පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

විදේශ විනිමය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා,— ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ නියෝග,— 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 118 වගන්තිය සමඟ කියවිය යුතු 142 වගන්තිය යටතේ වෛද්‍ය උපකරණ මිල නියම කිරීම සම්බන්ධයෙන් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 පෙබරවාරි 17 දිනැති අංක 2006/45 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.05.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*12.

අධිකරණ අමාත්‍යතුමා සහ බුද්ධශාසන අමාත්‍යතුමා,— අධිකරණ සංවිධාන පනත යටතේ නියෝගය,— 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 60 වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 61 වගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 මාර්තු 27 දිනැති අංක 2012/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.05.23 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

*13.

බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

ථේරවාදී භික්ෂු කතිකාවත් (ලියාපදිංචි කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*15.

වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා,— වෙළඳ නැව් පනත යටතේ නියෝග,— 1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 139 වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 321 වගන්තිය යටතේ බහාලුම් දළ ස්කන්ධ සත්‍යායන සම්බන්ධයෙන් වරාය හා නාවික කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 අගෝස්තු 11 දිනැති අංක 1979/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.02.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*16.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2016 ජූනි 22),— "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ (5)(අ) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව විසින් 2016 පෙබරවාරි 25 දිනැති අංක 1955/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.05.06 දින ඉදිරිපත් කරන ලද, ජනමතවිචාරණයකදී හෝ ඡන්ද විමසීමකට අදාළ කාලසීමාව තුළ විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය විසින් පිළිපැදිය යුතු උපමාන හෙවත් මාර්ගෝපදේශ/ මෙහෙයුම් ප්‍රතිපත්ති අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

17.

ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

18.

ළමා පුනරුත්ථාපන කේන්ද්‍රය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

19.

ශ්‍රී ලංකා එක්සත් ක්‍රිස්තියානි සහෝදරත්වය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

20.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

21.

මොනරාගල දිස්ත්‍රික් කාන්තා මහා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

22.

ලසාලියන් සමාජයීය අධ්‍යාපන සේවාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

23.

ජාත්‍යන්තර කාන්තා සහ ළමා අයිතීන් සුරැකීමේ සභාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

**[1]**

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---